# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 51 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 අගෝස්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 20 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 51 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 අගෝස්තු මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 15/80

## 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 51 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 24 දරන පනතින් ප්‍රතියෝජනය කරන ලද) 1968 අංක 24 දරන රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:— *1968 අංක 24 දරන පනතේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*"සංස්ථාවේ පොදු පරමාර්ථ.*

4. (1) සංස්ථාව විසින් ම හෝ යම් විදේශීය සහකාරයකු සමග—

(අ) ආණ්ඩුවට, පළාත් පාලන ආයතනවලට හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ යම් නීතියකින් හෝ නීතියක් යටතේ පිහිටුවනු ලැබූ යම් මණ්ඩලයකට අවශ්‍ය වන්නා වූ යම් මුද්‍රණ වැඩක් හෝ යම් මුද්‍රණ සහ ප්‍රකාශන වැඩක් කිරීම;

(ආ) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් පෞද්ගලික ආයතනයකට හෝ පුද්ගලයකුට අවශ්‍ය වන්නා වූ යම් මුද්‍රණ වැඩක් හෝ යම් මුද්‍රණ හා ප්‍රකාශන වැඩක් කිරීම;

(ඇ) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද පොත් හා ප්‍රකාශන නොවන්නා වූ සංස්ථාව විසින් මුද්‍රණය කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද පොත් හා ප්‍රකාශන විකිණීම හා බෙදා හැරීම භාර ගැනීම;

(ඈ) ලිපි ද්‍රව්‍ය හා වෙනත් අනුයාත නිෂ්පාදන නිපදවීම හා විකිණීම භාර ගැනීම; සහ

(ඉ) මෙහි මින් පෙර සඳහන් කරන ලද පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික සියලු වෙනත් ක්‍රියා හෝ දේ කිරීම

සංස්ථාවේ පොදු පරමාර්ථ විය යුතු ය.

(2) පාසල් පාඩම් පොත් මුද්‍රණය කිරීමට හා ප්‍රකාශයට පත් කිරීමට බාධාවක් නොවන පරිදි (1) (ආ) වන උපවගන්තියේ සඳහන් කවර වූ හෝ වැඩක්, කර ගෙන යා හැකි නම් මිස, සංස්ථාව විසින් භාර ගනු නොලැබිය යුතු ය.".

ඊ—57183—12,825 (07/81)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.